**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம்**
**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| පළමුවන වාරපරීක්ෂණය - 2018 | 11 ශ්‍රේණිය |
| First Term Test - 2018 | Grade 11 |

| | | |
|---|---|---|
| **ව්‍යාපාර ගිණුම්කරණ අධ්‍යයනය** | **II** | **කාලය පැය 2** |
| **Business and Accounting Studies** | **II** | **Two hours** |

- පළමු ප්‍රශ්නය ද තෝරා ගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගනු ලබන එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.

01. ඇගලුම් මෝස්තර ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා ඒ ආශ්‍රිත පෞද්ගලික ආයතනයක වසර දෙකක් සේවය කර තමන්ටම ඇඳුම් මැසීමේ ව්‍යාපාර ආයතනයක් ආරම්භ කිරීමට දමිති අදහස් කලාය. ඇය සේවය කල ආයතනයෙන් උපයාගත් වැටුපෙන් රු 500000 ක මුදලක්ද විය.

2017 01 01 ව්‍යාපාරය ආරම්භ කිරීම සිය පියාගේ ව්‍යාපාරික ගොඩනැගිල්ලේම සිදු කලාය. "දමිති Fashion" නමින් ව්‍යාපාරික කටයුතු ප්‍රචාරනය සඳහා නගරය පුරා පෝස්ටර් ප්‍රදර්ශණය කලාය.

පළමු සතිය තුළ පහත ගනුදෙනු සිදුවිය.

| | |
|---|---|
| 2017 01 02 අමුද්‍රව්‍ය ( රෙදි ) මිලදී ගැනුම | 120000 |
| 2017 01 03 මහන යන්ත්‍ර ගැනුම් | 80000 |
| ගෙන ඒමේ කුලී | 2000 |
| 2017 01 06 අත්පිට විකුනුම් | 60000 |
| ණයට විකුණුම් | 5000 |
| 2017 01 07 විවිධ වියදම් | 3000 |

i දමිතිගේ ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයට අයත්ද?

ii මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීම ගැන ඔබේ අදහස කුමක්ද?

iii දමිතිගේ ව්‍යාපාරය සතු ශක්තීන් දෙකක් සඳහන් කරන්න.

iv ඇය ඇයගේ අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා අනුගමනය කල ක්‍රියාමාර්ගය කුමක්ද?

v ඇයගේ ව්‍යාපාරයේ පවත්වාගත යුතු උපයෝගී පොත් 2 ක් සඳහන් කරන්න.

vi 2017 01 01 දින ගිණුම්කරණ සමීකරණය දක්වන්න.

vii ව්‍යාපාරයේ මුදල් පොත සකස් කරන්න.

viii 2017 01 01 දිනට මුදල් පොතේ ශේෂය දක්වන්න.

ix මෙම ව්‍යාපාරයේ ජංගම හා ජංගම නොවන වත්කම් සටහන් කරන්න.

x දමිතිගේ ව්‍යාපාරය තව තවත් සංවර්ධනය සඳහා ඔබ ඇයට ලබාදෙන උපදේශයක් දක්වන්න.

( ල 2 x 10 = 20 )

# I කොටස

( ගිණුම්කරණය ) ප්‍රශ්න 2 ට පමණක් පිළිතුරු සපයන්න

02. 2017 06 01 දින වරුණ ආරම්භ කල ලී බඩු ව්‍යාපාරයේ සිදුවූ ගණුදෙනු පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 2016 06 01 | ප්‍රාග්ධනය යෙදූවා | 500000 |
| 2016 06 02 | ලී බඩු මිලදී ගැනුම් | 2500000 |
| 2016 06 04 | ලී බඩු විකුණුම් | 1000000 |
| 2016 06 10 | පරිගණක යන්ත්‍රයක් ගත්තා | 60000 |
| 2016 06 20 | ලී බඩු ණයට විකුණුම් | 1500000 |
| 2016 06 25 | විවිධ වියදම් දැරීම | 10000 |
| 2016 01 30 | වරුණගේ පුද්ගලික ප්‍රයෝජනයට ගත්තා | 5000 |

i ඉහත ගණුදෙනු ලෙජර් ගිණුම්වල සටහන් කර 2016 06 30 දිනට ගිණුම් තුලනය කරන්න. ( ල 7 )

ii ශේෂ පිරික්සුම පිළියෙල කරන්න. ( ල 3 )

03. රවීන්ගේ ව්‍යාපාරයේ සුළු මුදල් භාරකරු ලෙස ඇගේ භාර්යාව කටයුතු කරයි. 2016 ජනවාරි පළමු සතිය තුළ රවීන් තම භාර්යාව වූ රවින්දිට රු 2500 ක මුදලත් ලබාදෙන ලදී. එම මුදල් පියවීම පිළිබඳ පහත පරිදි වවුචර් විය.

| | | | |
|---|---|---|---|
| ජනවාරි | 01 | ලිපිද්‍රව්‍ය ගැනුම් | 250 |
| | | ගමන් වියදම් | 60 |
| ජනවාරි | 02 | ලිපි තැපැල් | 30 |
| | | සිසල් බීම | 60 |
| ජනවාරි | 03 | ත්‍රීවීල් ගාස්තු | 50 |
| ජනවාරි | 04 | පෑන් | 100 |
| | | මුද්දර | 75 |
| ජනවාරි | 05 | සංග්‍රහ | 150 |
| ජනවාරි | 06 | ගමන් ගාස්තු | 80 |
| ජනවාරි | 07 | ගෙන ඒමේ කුලී | 150 |

i ඉහත තොරතුරු අදාල විශ්ලේෂණ තීරු යටතේ සුළු මුදල් පොතක සඳහන් කරන්න.

ii සුළු මුදල් පොත තුලනය කරන්න.

iiiඅග්‍රිමය ප්‍රතිපූරණය කරන්න.

iv අදාල ලෙජර් ගිණුම් සකස් කරන්න. ( ල 10 )

04. අ. 2017 01 31 දිනට ලක්මාගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ දැක්වූ හර ශේෂය රු 15000 ක් වියඑදිනට බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනය අනුව ශේෂය වෙනස් විය.

වෙනසට හේතු මෙසේය.

| | |
|---|---|
| ⋆ නිකුත්කල නමුත් බැංකුවට ඉදිරිපත් නොවූ චෙක්පත් | 3000 |
| ⋆ තැන්පත් කල නමුත් නිශ්කාෂණය නොවූ චෙක්පත් | 2500 |
| ⋆ බැංකුව අයකල බැංකු ගාස්තු | 500 |
| ⋆ ඍජු ප්‍රේෂණ | 250 |

⋆ ණයගැතියකු විසින් ඍජුව බැංකුවට එවූ රු 1000 ක චෙක්පත

i සංශෝධිත බැංකු ගිණුම

ii බැංකු සැසඳුම් ප්‍රකාශය ( ල 5 )

ආ මලින්තගේ ව්‍යාපාරයේ 2017 01 30 දිනට පිළියෙල කල ශේෂ පිරික්ෂුම සම නොවීය. එහි වෙනස වූ රු 2000 අවිනිශ්චිත ගිණුමේ හරට සටහන් කරන ලදී. පසුව සොයාගත් වැරදි මෙසේය.

⋆ ණය හිමියකුට ගෙවූ රු 300 ඔහුගේ ගිණුමට බැර කර තිබුණි.

⋆ දුන් වට්ටම රු 500 ලද වට්ටම් ගිණුමට බැර කර තිබුණි.

⋆ ගැනුම් ජනලය රු 700 ක් අඩුවෙන් එකතුකොට තිබුණි.

⋆ විවිධ වියදම් ගිණුමේ රු 1000 ක් ශේෂය ශේෂ පිරික්ෂුමට ඇතුලත් කර තිබුනේ රු 1300 ක් ලෙසය.

i ඉහත වැරදි නිවැරදි කිරීම සඳහා ජනල් සටහන් පෙන්වන්න.

ii අවිනිශ්චිත ගිණුම පිළියෙල කරන්න. ( ල 5 )

II කොටස

( ව්‍යාපාර අධ්‍යනය ) ප්‍රශ්න 2 ට පමණක් පිළිතුරු සපයන්න

05. මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම ව්‍යාපාරවල ප්‍රධාන අරමුණ වේ. ඒ සඳහා ව්‍යාපාරිකයන් විසින් විවිධ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරයි. වර්ථමානයේ බොහෝ ව්‍යාපාරික කටයුතු විද්‍යුත් මාධ්‍ය පදනම් කරගෙන සිදුවේ.

i මිනිස් අවශ්‍යතා හා වුවමනා යන්න හඳුන්වන්න. ( ල 2 )

ii භාණ්ඩ හා සේවා යන්න හඳුන්වන්න. ( ල 2 )

iiiනිෂ්පාදන සාධක නම් කර හඳුන්වන්න. ( ල 2 )

iv ව්‍යාපාරයක ඇල්මැති පාර්ශව දෙකක් නම් කර ඔවුන් ව්‍යාපාරයෙන් අපේක්ෂා කරනු ලබන අරමුණ බැගින් සඳහන් කරන්න. ( ල 2 )

v ව්‍යාපාර ආශ්‍රිත විද්‍යුත් මාධ්‍ය නවීන තාක්ෂණය උපයෝගී කරගනු ලබන අවස්ථා දෙකක් සඳහන් කරන්න. ( ල 2 )

06. i ව්‍යාපාර වර්ග කල හැකි පදනම් කවරේද? ( ල 2 )

ii පහත ව්‍යාපාර සංවිධාන අයත් වර්ගය සඳහන් කරන්න.

- ⋆ කමනී ස්ටෝර්ස්
- ⋆ කුරේ සහ සමාගම
- ⋆ රාජ්‍ය දැව සංස්ථාව
- ⋆ අධ්‍යාපන දෙපාර්ථමේන්තුව ( ල 1/2 x 4 = 2 )

iii තනි පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය සඳහන් කරන්න. ( ල 3 )

ix වෙළදාම යන්න හඳුන්වා එහි ප්‍රබේද නම් කරන්න. ( ල 3 )

07. i බලපත්‍රලාභී වාණිජබැංකුවක පවත්වා ගත හැකි තැන්පතු වර්ග මොනවාද? ( ල 2 )

ii ව්‍යාපාරිකයකුට ජංගම ගිණුමක් ඇරඹීමෙන් සැලසෙන සැලසෙන වාසි 4 ක් සඳහන් කරන්න. ( ල 2 )

iiiරක්ෂණ මූලධර්ම හඳුන්වා ඉන් 1 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. ( ල 2 )

iv ප්‍රවාහනයේ මූලිකාංග සඳහන් කර කෙටියෙන් හඳුන්වන්න. ( ල 2 )

v කළමණාකරණය යන්න නිර්වචනය කරන්න. ( ල 2 )